කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරීන්ගේ වාර්ෂික අභ්‍යන්තර

ස්ථාන මාරු පටිපාටිය

**1.** හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 202 වගන්තියේ විධිවිධාන අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු නිලධාරීන් සඳහා වන වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පටිපාටිය.

**2. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා යටත් වන නිලධරයන් පිළිබඳ විස්තර**

**2.1 අදාළ නිලධරයන්**

කම්කරු දෙපාර්තමේන්තුවේ සේවය කරන දෙපාර්තමේන්තු සේවයට අයත් කම්කරු නිළධාරි (II/I) නිලධරයන් සඳහා මෙම වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය අදාල වේ.

**2.2 සේවා ස්ථානයක සම්පූර්ණ කල යුතු සේවා කාලය**

2.2.1 කම්කරු දෙපාර්තමේන්තුවේ කලාප කම්කරු කාර්යාලයක හෝ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයක හෝ කම්කරු කාර්යාලයක හෝ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලයක හෝ ප්‍රධාන කාර්යාලයේ අංශයක හෝ වන පරිදි තම සේවා ස්ථානයේ අඛණ්ඩව වසර 02 ක් සේවය කරන ලද නිලධරයන් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු වීම් සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි. නව පත්වීමක් ලැබූ නිලධාරියෙකු නම් පළමු සේවා ස්ථානයේ අවම වශයෙන් වසර 03ක් සේවය කර තිබීම ස්ථාන මාරුවක් ඉල්ලීමට සුදුසුකමක් වේ.

2.2.2 එකම සේවා ස්ථානයක හෝ එකම පරිශ්‍රයක් තුල පිහිටා ඇති සේවා ස්ථාන කිහිපයක වසර 05 කට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධරයන් අනිවාර්යෙන්ම ස්ථාන මාරු වීම් වලට යටත් වේ.

2.2.3 ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථාන වල වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධරයන් ස්ථාන මාරුවීම් වලට යටත් වේ.

**2.3 සේවා ස්ථාන වර්ගීකරණය**

**2.3.1 දුර ප්‍රමාණය අනුව සේවා ස්ථාන වර්ගීකරණය**

ඉතා ප්‍රිය මනාප සේවා ස්ථාන - පදිංචි නිවසට කි.මී.10ට අඩු දුරින් පිහිටි ස්ථාන

ප්‍රිය මනාප සේවා ස්ථාන - පදිංචි නිවසට කි.මී.10- කි.මී.30 දුරින් පිහිටි ස්ථාන

ප්‍රිය මනාප නොවන ස්ථාන - පදිංචි නිවසට කි.මී.30 - කි.මී.60 දුරින් පිහිටි ස්ථාන

දුෂ්කර සේවා ස්ථාන - පදිංචි නිවසට කි.මී.60 - කි.මී.100 දුරින් පිහිටි ස්ථාන

ඉතා දුෂ්කර සේවා ස්ථාන - පදිංචි නිවසේ සිට කි.මී.100ට වැඩි දුරින් පිහිටි ස්ථාන

2.3.2 නිලධාරීන්ගේ ඉල්ලීමේ ස්වභාවය අනුව සේවා ස්ථාන වර්ගීකරණය

ඉතා ප්‍රිය මනාප සේවා ස්ථාන - වැඩි ඉල්ලුමක් සහිත සේවා ස්ථාන

ප්‍රිය මනාප සේවා ස්ථාන - සාමාන්‍ය ඉල්ලුමක් සහිත සේවා ස්ථාන

දුෂ්කර සේවා ස්ථාන - ඉල්ලුම අඩු සේවා ස්ථාන

ඉතා දුෂ්කර සේවා ස්ථාන - නිලධාරීන්ගෙන් ඉතා අඩු ඉල්ලුමක් සහිත සේවා ස්ථාන

සටහන

පෞද්ගලික ලිපි ගොනුවෙහි සඳහන් පෞද්ගලික ලිපිනය නිවැරදි ලිපිනය ලෙස සලකනු ලැබේ. පෞද්ගලික ලිපිනය වෙනස් වන අවස්ථාවන්හිදී නිලධාරියා විසින් වහාම පෞද්ගලික ලිපිගොනුව යාවත්කාලීන කිරීම සඳහා ඒ බව ආයතන අංශය වෙත දැනුම් දිය යුතුය. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු වීම් අයදුම් කරන අවස්ථාවේ පෞද්ගලික ලිපිගොනුවේ සඳහන් ලිපිනයට වෙනස් ලිපිනයක් සඳහන් කරන්නේ නම් එහි සත්‍යතාවය ග්‍රාම නිලධාරි සහතිකයක් මගින් සනාථ කළ යුතුය.

**2.4 ක්‍රමවේදය සහ අනෙකුත් කරුණු**

i. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ප්‍රතිපත්තියෙහි 2.2.1 ඡේදය යටතට ගැනෙන නිලධරයකු වෙනත් ස්ථානයකට මාරුවීමට ඉල්ලා ඇති විටක ,එම ඉල්ලීම ඉටු කිරීම සඳහා එහි 2.2.2 ඡේදයේ අවශ්‍යතා සපුරා ඇති එක් සේවා ස්ථානයක හෝ සේවා ස්ථාන සමූහයක් තුල වැඩිම සේවා කාලයක් සහිත නිලධරයන් ඉන් පිටතට මාරු කල හැකිය.

ii. යම් සේවා ස්ථානයක ස්ථාන මාරු වීමට වැඩි ඉල්ලීම් ප්‍රමාණයක් ඇති විට ඒ අතුරින් වැඩි සේවා කාලයක් හෝ ඉහත 2.2.2 හි අවශ්‍යතා සම්පූර්ණ කර ඇති නිලධරයකු (අනෙකුත් කොන්දේසිවලට යටත්ව) එම සේවා ස්ථානයට මාරු කරනු ලැබේ.

iii. ප්‍රියමනාප නොවන දුෂ්කර සහ ඉතා දුෂ්කර සේවා ස්ථානයක සේවය කල නිලධරයකු යම් සේවා ස්ථානයකට මාරුවීමක් ඉල්ලා ඇති විට එම ඉල්ලීම ඉටු කිරීමට එකී ස්ථානයේ,ඉහත 2.2.2 හි අවශ්‍යතා සම්පූර්ණ කල වැඩිම සේවා කාලයක් සහිත නිලධරයා ඉන් පිටතට මාරු කල හැකිය.

iv. ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථානයන්ට ස්ථාන මාරුවීම් ලබා දීමේදී වඩාත් ප්‍රමුඛතාවය දක්වන්නේ ඉතා දුෂ්කර, දුෂ්කර සහ ප්‍රියමනාප නොවන ස්ථානවල සේවය කල නිලධාරින්ටය.මෙවැනි ස්ථාන මාරුවීම්වලදී සේවා කාලය හා නිලධරයන් ඉදිරිපත් කර ඇති ප්‍රායෝගික ගැටළු තත්වයන්ද සළකා බලනු ලැබේ.

v. ඉතා ප්‍රියමනාප, ප්‍රියමනාප සේවා ස්ථානවලට කරනු ලබන ස්ථාන මාරු ඉල්ලීමක් ඉටු කිරීමේදී , ස්ථාන මාරු වලට අනිවාර්යෙන්ම යටත් වන නිලධාරීන් විසින් කරනු ලබන ඉල්ලීම්ද සලකා බලනු ලබන නමුත් එහිදී ස්ථාන මාරු ඉල්ලා සිටින නිලධරයන්ගේ ඉල්ලීමට , ස්ථානමාරු වලට අනිවාර්යෙන්ම යටත් විය යුතු නිලධරයන්ගේ ඉල්ලීම් වලට වඩා ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.

vi. කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි සේවක අර්ථසාධක අරමුදල් අංශය, සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය, විශේෂ විමර්ෂණ අංශය, කාන්තා හා ළමා කටයුතු අංශය, ශ්‍රම ප්‍රමිති අංශය, නීති ක්‍රියා අංශය, කාර්මික සම්බන්ධතා අංශය, මානව සම්පත් සංවර්ධන අංශය යන අංශයක හෝ කලාප කාර්යාලයක අවම වශයෙන් අවුරුදු 2ක් අනිවාර්යෙන්ම තම සේවා කාලය තුලදී සේවය කළ යුතුය.ප්‍රධාන කාර්යාලයේ අංශයක/කලාප කාර්යාලයක සේවය කරන නිලධාරියෙකු ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරිමේදි අනෙකුත් නිලධාරින්ට වඩා ප්‍රමුඛතාව ලබා දී කටයුතු කරනු ලබන අතර ඊට පෙර අංශයක/කලාප කාර්යාලයක සේවය නොකරන නිලධාරින් අංශ වෙත ස්ථාන මාරු කිරිමට කටයුතු කරනු ලැබේ.

vii. ස්ථාන මාරු කමිටු විසින් නිලධරයන් මාරු කිරීමේදී දෙපාර්තමේන්තුවේ සේවා අවශ්‍යතාවයන් ද කාර්යාලවල කාර්ය මණ්ඩල කනිෂ්ඨ/ජේෂ්ඨතාවයේ සමබරතාවය රැකිමට ද හැම විටම උත්සහ කළ යුතු වේ. ස්ථාන මාරු ලබාදිමේදී එක් කාර්යාලයකට අදාළ නිළධාරින්ගෙන් 25%ක ප්‍රමාණය නොඉක්මවන ලෙස ස්ථාන මාරු නියෝග නිකුත් කළ යුතුය.

viii. ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක නොවන්නේ නම්, කම්කරු කොමසාරිස් ජනරාල් විසින් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග අනුව කටයුතු නොකරන නිලධාරීන්ගෙන් එසේ නොකිරීමට හේතු විමසනු ලැබේ.

ix. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුව වෙත සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම මත ස්ථාන මාරු වීම් ලබා දීමේ ගැටළු පැන නැගී ඇත්නම් සමාලෝචන කමිටුව මගින් එම කරුණු සලකා බලා නව ස්ථාන මාරු ලබා දීමෙ හැකියාව ඇති අතර එවැනි නිලධරයන් විසින් සිදු කරන අභියාචනා නැවත සලකා බලනු නොලැබේ.

**2.4.1 සේවා කාලය ගණනය කිරීම.**

i. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් වලදී කාලය ගණනය කරනු ලබන්නේ පෙර වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දිනයටය. ( 2022 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2021.12.31 දිනයට)

ii. සේවා කාලයන් ගණනය කිරීමේදී සේවයේ ආරම්භක දිනය ලෙස සැලකිය යුත්තේ සේවයට වාර්තා කල වර්ෂයේ ජනවාරි මස පළමු දිනයයි.නමුත් නිලධරයාගේ පාලන විෂයය ඉක්මවා ගිය කරුණක් හේතුවෙන් සේවයට වාර්තා කල දිනය පසු දිනයක් වේ නම් ස්ථාන මාරු කමිටුව ඒ පිළිබද සැලකිල්ල යොමු කරනු ලැබේ.(තවද නිලධරයාගේ පාලන විෂයය ඉක්මවා ගිය හේතුවක් මත සේවයේ නොසිටි කාලය ස්ථාන මාරු සේවා කාලය සදහා ගණන් ගනු නොලැබේ.)

iii. දිස්ත්‍රික්කයක් තුළ සේවා කාලය ගණන් ගැනීමේදී එම දිස්ත්‍රික්කය තුල කුමන කාර්යාලයක සේවය කල ද දිස්ත්‍රික් සේවා කාලය ගණන් ගැනේ.

iv. දිස්ත්‍රික්ක 02ක් තුල ආසන්නයේ ඇති නාගරික කාර්යාලයන් අතර දිස්ත්‍රික්ක පදනමින් බැහැරව ස්ථාන මාරු කිරීමට සළකා බලනු ලැබේ. එකම පරිශ්‍රයක් තුල පිහිටි කුමන කාර්යාලයක සේවය කලද එම සේවා කාලයන්හි එකතුව එකම පරිශ්‍රයක් තුල සේවා කාලය සඳහා සලකා බලනු ලැබේ. (එකම පරිශ්‍රයක් තුල පිහිටි සේවා ස්ථාන ඇමුණුම 1 වශයෙන් දක්වා ඇත.)

v. ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කරනු ලබන නිලධරයකු හට එම සේවා ස්ථානයේ වසර 05ක කාලයක් සේවය කිරීමට අවස්ථාව හිමිවේ.

vi. කාර්යාල ස්ථාපිතවීම හෝ අහෝසිවීම හේතුවෙන් එක් කාර්යාලයක සිට වෙනත් කාර්යාලයකට අනුයුක්ත කිරීමට සිදුවූ නිලධරයන් සම්බන්ධයෙන් සේවා කාලය ගණනය කිරීමේදී අහෝසි කරන ලද කාර්යාලයේ සේවා කාලයද විනය හේතු හෝ දඬුවම් මාරුවක් ලෙස ස්ථාන මාරු ලද නිලධාරීන් හැර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අවශ්‍යතාවය මත ස්ථාන මාරු ලද නිලධාරීන්ගේ සේවා කාලය ගණනය කිරීමේදී ඔවුන් අවසන් වරට සේවය කළ සේවා ස්ථානයේ සේවය කළ සේවා කාලයද අයදුම්පත් ඉදිරිපත් කිරීමට අවශ්‍ය අවම සේවා කාලය සඳහා ගණන් ගනු ලැබේ.

### 2.4.2 ඉතා ප්‍රියමනාප, ප්‍රියමනාප සේවා ස්ථානවල සේවා කාලය ගණනය කිරීම

i. ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියකුට නැවත එවැනි සේවා ස්ථානයකට මාරු වීමට ඉල්ලුම් කළ හැක්කේ ප්‍රියමනාප නොවන, දුෂ්කර සහ ඉතා දුෂ්කර සේවා ස්ථාන වල වසර 10ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් පමණි.

එසේ වුවද, වෙනත් නිලධාරියෙකු විසින් ඉල්ලුම් කර නොමැති අවස්ථාවකදී පමණක් මෙවැනි නිලධාරියෙකු ප්‍රියමනාප හෝ ඉතා ප්‍රිය මනාප සේවා ස්ථාන වෙත මාරු කිරීම සඳහා සලකා බලනු ලැබේ.

ii. සේවාවන් එකකට වඩා වැඩි ගණනක සේවය කල නිලධරයන්ගේ ප්‍රියමනාප සේවා කාලය ගණන් ගැනීමේදී පෙර සේවයකදී එම සේවයට ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප වූ කාර්යාලයක සේවය කර ඇත්නම් එම සේවා කාලය ද ගණන් ගනු ලැබේ.

iii. ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප යැයි සැළකෙන සේවා ස්ථානයක දැනට සේවය කරන නිලධාරිනියකගේ සේවා ස්ථානයක සේවා ගණනය කිරීමේදී එම කාලය තුල ලබා ගෙන ඇති ප්‍රසූත නිවාඩු (වැටුප් සහිත අඩ වැටුප් සහ වැටුප් රහිත) කාලය ගණනය කරනු නොලැබේ.

iv. ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථානවල සේවය කරන නිලධරයන් විසින් නැවත ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථානයකට කරනු ලබන මාරු ඉල්ලීම් සළකා බලනු ලබන්නේ එම සේවා ස්ථානවලට ප්‍රියමනාප නොවන, දුෂ්කර හෝ ඉතා දුෂ්කර සේවා ස්ථානවල සේවය කරන නිලධරයන් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

v. ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථානවල සේවයේ නියුතු නිලධාරිනියන් එම සේවා කාලය තුල ප්‍රසූත නිවාඩු ලබා තිබේ නම් ඒ බව වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු මණ්ඩලය සඳහා අයදුම්පත් කැඳවීමේදී අනිවාර්යෙන්ම සඳහන් කළ යුතු වේ.ඒ සම්බන්ධයෙන් පසුව ඉදිරිපත් කරන ලබන ඉල්ලීම් සළකා බලනු නොලැබේ.

**2.4.3 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු විසින් කටයුතු නොකළ යුතු අවස්ථා**

දෙපාර්තමේන්තුවේ ඕනෑම අංශයකට කාර්යාලයකට වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු වීම් ලබාදිය හැකිය.නමුත් අංශය තුළ පවතින ශාඛා සඳහන් කරමින් ස්ථාන මාරු වීම් ලබා නොදිය යුතුය. යම් නිලධාරියකු තව දුරටත් රඳවා ගැනීමට එම කාර්යාල ප්‍රධානියා විසින් කරනු ලබන නිර්දේශය සලකා බැලීමට වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවට හැකියාවක් ඇත.

**3. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

අංක 1914/8 හා 2015.05.12 දිනැති ගැසට් පත්‍රයේ පළවූ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 200 සංශෝධනයට අනුව කම්කරු දෙපාර්තමේන්තුවේ සේවය කරන දෙපාර්තමේන්තු සේවයට අයත් 2.1 හි සඳහන් නිලධරයන්ට අයත් වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවක සංයුතිය පහත පරිදි වේ.

i. කම්කරු කොමසාරිස් (පාලන) - සභාපති

ii. සහකාර කම්කරු කොමසාරිස් (ආයතන)

iii. වෙනත් අංශයක විධායක II/III ශ්‍රේණියේ නිළධාරියෙක්

iv. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවේ විෂය පථයට අයත් වන නිලධර කණ්ඩායම්වලට හා සේවාවට අයත් රජයේ නිලධරයන්ගෙන් අවම වශයෙන් 15%ක නියෝජනයක් සහිත සෑම වෘත්තිය සමිතියක් විසින්ම නම් කළ නියෝජිතයෙක් හෝ පූර්ණ කාලීනව වෘත්තිය

සමිති කටයුතු සඳහා නිලධරයෙකු මුදා හැර ඇති සෑම වෘත්තීය සංගමයකම නම් කළ නියෝජිතයෙක්

**4. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර**

සමාලෝචන කමිටුවල සංයුතිය පහත පරිදි වේ.

i.අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (පරිපාලන) - සභාපති

ii.වෙනත් අංශයක කම්කරු කොමසාරිස්වරයෙක්

iii.නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (පාලන)

**5 . වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ලබා දීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු**

**5.1 විශේෂිත කරුණු**

I. යම් නිලධරයකුගේ කලත්‍රයා පොලිසියේ හෝ ත්‍රිවිධ හමුදාවේ උතුරු නැගෙනහිර ක්‍රියාන්විත රාජකාරියේදී අබාධිත තත්වයකට පත්ව ඇති බවට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කරන විට නිලධරයන්ගේ ස්ථාන මාරුවීම් කළයුතු වන්නේ ඔවුන්ගේ ඉල්ලීම් අනුව පමණි.එවැනි නිලධරයන්ගේ අභ්‍යන්තර ස්ථාන මාරු ඉල්ලීම් පිළිබඳව ප්‍රමුඛත්වය දැක්විය යුතු වේ.මෙවැනි නිලධරයන් ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථානයකින් පිටතට මාරු කිරීමට සිදුවන්නේ නම් එම ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථානයට ආසන්නම කාර්යාලයකට හෝ නිලධරයාගේ ඉල්ලීමකට අනුව ප්‍රියමනාප නොවන කාර්යාලයකට මාරු කල යුතුය.තවද මෙවැනි නිලධාරීන් සඳහාද ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථාන ලබා දිය හැක්කේ සේවා කාලය පදනම්ව පමණි. (වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුව වෙත ඉදිරිපත් කරනු නොලැබූ ඉල්ලීම් සම්බන්ධයෙන් පසුව සලකා බලනු නොලැබේ.)

II. සෑම විටම නිලධරයාගේ ඉල්ලීම අනුව තම කලත්‍රයාගේ සේවා ස්ථානය අයත් ප්‍රදේශයට ආසන්න සේවා ස්ථානයකට මාරුවීම් ලබා දීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුතු අතර ඉතා දුෂ්කර, දුෂ්කර සහ ප්‍රියමනාප නොවන්නාවූ කාර්ය ස්ථානයන්හි සේවය සඳහා නිලධරයන් තෝරා ගැනීමේදී පාසල් යන දරුවන් ඇති විවාහක නිලධරයන්ට වඩා අවිවාහක නිලධරයන් ද ,පාසල් යන දරුවන් නොමැති විවාහක නිලධරයන් ද හැකි සෑම අවස්ථාවකදීම තෝරා ගැනීමට ප්‍රමුඛතාවය ලබා දේ.

III. පාසල් යන දරුවන්, ආබාධිත දරුවන්, දීර්ඝ කාලීන අසනීප මත එක් තැන්ව සිටින කලත්‍රයන් සහ කලත්‍රයා විදේශගතව සිටින අවස්ථාවන්හි සහ අවිවාහකව තම වයස්ගත දෙමාපියන් රැක බලා ගන්නා අවස්ථාවන් වැනි පිළිගත හැකි කරුණු ඇතිව තම කාර්යාල ප්‍රධානීගේ නිර්දේශයන් සහිතව ඉදිරිපත් කරන ඉල්ලීම් පිළිබඳ සැලකිල්ලට ගෙන මාරුවීම් සම්බන්ධව සළකා බලනු ලැබේ.

IV. ආබාධිත, පුනරුත්ථාපන කොන්දේසි යටතේ බඳවාගත් නිලධාරීන් ඔවුන්ගේ ඉල්ලීමක් නොමැති කල්හි ස්ථාන මාරුවීම් කළ හැක්කේ පහත සඳහන් අවස්ථාවන්හිදි පමණි.මෙම නිලධාරීන්ව ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප සේවා ස්ථාන වලට ස්ථාන මාරු කිරීම කළ හැක.ඔවුන් සේවය කරන කාර්යාල පිහිටි පරිශ්‍රය තුළ කම්කරු දෙපාර්තමේන්තුවේ වෙනත් සේවා ස්ථාන පවතී නම් එකම පරිශ්‍රය තුළ පවතින සේවා ස්ථානමාරු කිරීම කළ හැක.

**5.2 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම්වලට යටත් නොවන නිලධාරීන්**

I. අවුරුදු 53 ඉක්මවූ නිලධරයන් දිස්ත්‍රික්කය තුළ වෙනත් සේවා ස්ථානයකට මාරු කළ හැකි වුවද ඔවුන්ගේ ඉල්ලීමක් නොමැතිව දිස්ත්‍රික්කයෙන් පිටතට මාරු නොකළ යුතුය.

II. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු සඳහා කාල ගණනය කරනු ලබන දෙසැම්බර් 31 දිනට වයස අවු: 58 ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලීමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුල වුවද මාරු නොකළ යුතුය.

**5.3 වෘත්තිය සංගම් සඳහා අනුග්‍රහය**

I. කම්කරු කොමසාරිස් ජනරාල් විසින් ලියාපදිංචි කරනු ලැබූ වෘත්තිය සංගමයක, සංවිධානයක ලේකම්, සභාපති, භාණ්ඩාගාරික හා මධ්‍ය විධායක සභිකයන් මාරු කරන්නේ නම් අදාල වෘත්තිය සංගමයේ ලේකම්ගේ නිර්දේශ සැලකිල්ලට ගෙන සංගමයේ කටයුතුවලට බාධා නොවන සේවා ස්ථානයකට මාරු කල යුතුය

II. මෙම වගන්තියේ දැක්වෙන අනුග්‍රහ භුක්ති විදීමට අපේක්ෂා කරන වෘත්තිය සංගම්වල නිලධරයන් සංගමයේ ලේකම් මගින් ඒ සඳහා අයදුම්පත්‍රයක් පිළියෙළ කර (ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.5 උපවගන්තිය අනුව) ස්ථාන මාරු කමිටු රැස්වීමට සති දෙකකටවත් පෙර කම්කරු කොමසාරිස් ( පාලන) වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 7.2 උපවගන්තිය අනුව අනුග්‍රහය ලබා දිය යුතු වන්නේ ,කවර නිලතල වලටද යන වගත්, කුමන සංගමයකටද යන වගත්, අනුයුක්ත කලයුතු වන්නේ කවර ස්ථාන වලටද යන වගත්,කම්කරු කොමසාරිස් ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.මේ පිළිබඳව පසුව ඉදිරිපත් කරන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.ඉතා ප්‍රියමනාප, ප්‍රියමනාප සේවා ස්ථානවල රැඳී සිටීමට මෙම අනුග්‍රහය අදාල කර ගත නොහැක.

**6. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කාල සටහන**

| | කාර්යය | දිනය |
|---|---|---|
| **01.** | වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුව පිහිටුවීම | ජූනි මස 01 දිනට පෙර |
| **02.** | වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු දැන්වීම් නිකුත් කිරීම | ජූනි මස 30 දිනට පෙර |

| | | |
|---|---|---|
| 03. | සම්පූර්ණ කරන ලද වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ බලධාරියා වෙත ඉදිරිපත් කිරීම | ජූලි මස 31 දිනට පෙර |
| 04. | අදාළ බලධරයා විසින් අයදුම්පත්‍ර ස්ථාන මාරු කමිටුවට භාර දීම | අගෝස්තු මස 15 දිනට පෙර |
| 05. | වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම | අගෝස්තු මස 31 දිනට පෙර |
| 06. | යෝජිත වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම සහ වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු පත් කිරීම | සැප්තැම්බර් මස 15 දිනට පෙර |
| 07. | ස්ථාන මාරුවීම් පිළිබඳ සමාලෝචන කමිටු සඳහා අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය | සැප්තැම්බර් මස 30 දිනට පෙර |
| 08. | වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම | ඔක්තෝබර් මස 15 දිනට පෙර |
| 09. | වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරුවීම් අවසාන නියෝග නිකුත් කිරීම | නොවැම්බර් මස 01 දිනට පෙර |
| 10. | වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග බලාත්මක කිරීම | ජනවාරි මස 01 |

**7. ස්ථාන මාරු තීරණවලට එරෙහි අභියාචනා සම්බන්ධ ක්‍රියා පටිපාටිය**

7.1 වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු කිරීමක් පිළිබඳව බලය අභිනියෝජිත බලධරයා විසින් දෙන ලද නියෝගයකින් අතෘප්තියට පත් වූ කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය ආකෘති පත්‍ර 03A අනුව පමණක් සියලුම අදාළ තහවුරු කිරීමේ ලියවිලිවල සහතික කළ පිටපත් ද සමඟ ඉදිරිපත් කළ යුතු වන්නේ ය.

7.2 රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ යථායෝග්‍ය පරිදි අදාළ ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා, අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ/හෝ බලය අභිනියෝජිත බලධරයා මගින් පමණක් වන්නේය.

7.3 එසේ වුවද, එකී අභියාචනයේ ප්‍රගමන පිටපතක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත සෘජුවම යොමු කිරීමට එම රජයේ නිලධරයාට හැකියාව ඇත්තේ ය.

7.4 වාර්ෂික ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරනු ලබන අභියාචනයක් එම ස්ථාන මාරු කිරීමේ නියෝගය ප්‍රසිද්ධියට පත්කරන ලද දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වන්නේ ය. නියමිත කාලය තුළ දී ඉදිරිපත් නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

7.5 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාරදෙනු ලබන අභියාචනයට අදාළ සියලු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, අභියාචනය පිළිබඳ ස්වකීය නිරීක්ෂණ හා මෙහි දැක්වෙන ආකෘති පත්‍ර අංක 03A හා 03B සමග නිර්දේශ සහිත එම අභියාචනය නොවැම්බර් මස 15 දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට අදාළ ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හා අමාත්‍යාංශ ලේකම්වරයා හා බලය අභිනියෝජිත බලධරයා කටයුතු කළ යුතු වන්නේ ය.

7.6 එවැනි අභියාචනයක් ලැබී දින 15 ක් ඇතුළත ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව කටයුතු කරනු ලබන්නේ ය.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපත් අදාළ පරිදි කම්කරු අමාත්‍යාංශයේ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානී වෙත යවනු ලබන්නේ ය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයකින් හෝ අතෘප්තියට පත්වන රජයේ නිලධරයෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේ ය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

[signature]

ආර් පී ඒ විමලවීර
ලේකම්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
7 වන මහල, "මෙහෙවර පියස"
නාරාහේන්පිට, කොළඹ 05

ලේකම්

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

දිනය - 2022.09.07

නිල මුද්‍රාව

ඇමුණුම - 01

එකම පරිශ්‍රයක් තුල පිහිටා ඇති කාර්යාල

1. මධ්‍යම කලාප කම්කරු කාර්යාලය
   මහනුවර දකුණ දිස්ත්‍රික් කම්කරු කාර්යාලය
   මහනුවර උතුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය
   දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය- මහනුවර

2. සබරගමු කලාප කම්කරු කාර්යාලය
   අවිස්සාවේල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය
   දිස්ත්‍රික් කම්කරු කාර්යාලය - රත්නපුර

3. දකුණු කලාප කම්කරු කාර්යාලය
   දිස්ත්‍රික් කම්කරු කාර්යාලය - ගාල්ල
   ගාල්ල දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය

4. ඌව කලාප කම්කරු කාර්යාලය
   දිස්ත්‍රික් කම්කරු කාර්යාලය - බදුල්ල
   බදුල්ල දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය

5. වයඹ කලාප කම්කරු කාර්යාලය
   දිස්ත්‍රික් කම්කරු කාර්යාලය - කුලියාපිටිය

6. කුරුණෑගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය
   කුරුණෑගල දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය

7. නැගෙනහිර කලාප කම්කරු කාර්යාලය
   දිස්ත්‍රික් කම්කරු කාර්යාලය - ත්‍රිකුණාමලය

8. උතුරු කලාප කම්කරු කාර්යාලය
   දිස්ත්‍රික් කම්කරු කාර්යාලය - යාපනය
   යාපනය දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය

9. උතුරු මැද කලාප කම්කරු කාර්යාලය

දිස්ත්‍රික් කම්කරු කාර්යාලය - අනුරාධපුරය

අනුරාධපුරය දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය

10. බස්නාහිර කලාප II කම්කරු කාර්යාලය

කළුතර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය

කළුතර දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය

11. දිස්ත්‍රික් කම්කරු කාර්යාලය - ගම්පහ

ගම්පහ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාලය